**හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2016වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයේ සැපයුම් උපකරණ මිලදී ගැනීම් ලෙස රු.334,135 කින් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

(ආ) ඉතිරි කිරීම් ගිණුම් දෙකක වටිනාකම රු. 35,973 ක් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඇ) ඉතිරි කිරීමේ ගිණුම් දෙකක වටිනාකම රු.916,499 ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හා කරත්ත වල වටිනාකම රු.5,638,432 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.1,650,583 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඊ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ලී බඩු සහ සවිකිරීම් වල වටිනාකම රු.287,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.48,285 ක් අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි.

(ඌ) හිඟහිටි උසාවි දඩ ආදායම් ලෙස රු.720,271 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී රු.5,594,891 කින් නොසැසඳුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.21,613,186 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.18,451,022 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.63,101,076 ක් වටිනා ගිණුම් විෂයන් 05 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය | අනවසර ඉදිකිරීම් 09 ක් ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති-1988 | |
| | (i) රීති 164 | සභාවේ ගිණුම් පොත්පත් හා ලියකියවිලි දෛනිකව පරීක්ෂා කර නොතිබුණි. |
| | (ii) අංක 217 හා 218 | ඉඩම් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයන් කර ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 1980 අංක 47 දරන ජාතික පනත සහ අංක 1523/16 2008 ක් වූ ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 'ඇ' කොටස | තේ කර්මාන්ත ශාලා 04 ක් සහ ව්‍යාපාර 56 ක් පාරිසරික සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර දරන වර්ෂ නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 880, 2005 මාර්තු 24 දිනැති ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අංක 2/මු/1 දරන ලිපිය සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180 | ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් 09 දෙනෙකු ඇප තැන්පත් කර නොතිබුණි. |
| | (ii) මු. රෙ. 110 | අලාභ හානි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | (iii) මු. රෙ. 384 (3) | චෙක්පත් සම්බන්ධව ආරක්ෂාව හා භාරයේ තබා ගැනීම සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

(iv) මු. රෙ. 756 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඉ) 2002 දෙසැම්බර් 02 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය — පරිගණක හා උපාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,080,555 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,679,636 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

2016 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.1,268,303 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායමෙන් සියයට 25 ක් එනම් රු.749,915 ක් එදිනට හිඟව තිබුණි.

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.5,018,688 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) එකතුව රු.481,110 ක් වූ නොපියවූ අත්තිකාරම් 2016 දෙසැම්බර් 31 දක්වා නිරවුල් කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොස්ලන්ද නිකපොත උපකාර්යාලයේ ආදායම් එකතු කිරීම සඳහා භාවිතා කරන ලද ලදුපත් ආපසු භාරදී නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අවස්ථා දෙකකදී ඉවත්කරන ලද යන්ත්‍ර කොටස් දෙකක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාව තුල නිශ්කාර්යව පැවතුණි.

### 3.3 ආර්ථික නොවන ගනුදෙනු

2010 වර්ෂයේ රු.6,591,627 ක් වියදම් කර ඉදිකරන ලද කොස්ලන්ද වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලට පිවිසීම සඳහා මාර්ගයක් ඉදි නොකිරීම හේතුවෙන් වෙළෙඳ කටයුතු සඳහා ලබාදීමට නොහැකිවී තිබුණි. ඒ සඳහා වාර්ෂිකව රු.865,247 ක ණය සහ පොලිය සභා අරමුදලින් දරා තිබුණි.

3.4 **හඳුනාගත් අලාභ**

අංක 910 නැමති රු.80,237 ක් වටිනා උපකරණය අස්ථානගතවී තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

අයවැය ලේඛනය ඵලදායී පාලන උපකරණයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **වත්කම් කළමනාකරණය**

(අ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ආ) **පරිගණක ලේඛනයන් නඩත්තු කිරීම**

2002 /IAI/02 භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව පරිගණක හා උපාංග ලේඛනයන් නඩත්තු කර නොතිබුණි.

(ඇ) **උත්සව භාණ්ඩ ලබාදීම**

රජයේ ආධාර ලබා ගැනීමට සුදුසුකමක් නොතිබූ පාර්ශවයන්ට රු. 39,000 ක් වටිනා උත්සව භාණ්ඩ ලබාදී තිබුණි.

(ඈ) **රු.250,000 ක් වටිනා ද්‍රව්‍ය ලබාදීම**

පහල විහාරගල කම්කරු නිවාස අලුත්වැඩියාවට රු.250,000 ක් වටිනා සෙවිලි තහඩු ලබාදී තිබූ අතර භෞතික පරීක්ෂාවේදී එවැනි ප්‍රතිලාභීන් සිටින බවට තහවුරු නොවුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) ණයගැතියෝ සහ ණයහිමියෝ
(ඉ) ස්ථාවර වත්කම්